# සාලිය අසෝකමාලා පුරාවෘතය මුද්‍රා නාට්‍යයක් ලෙස වේදිකාවට

ජනකාන්ත සංගීත ශිල්පි රූකාන්ත ගුණතිලක ගේ මෙල්බන් සහ සිඩ්නි සංචාරයේදී ඔහු මා සමග කී මේ කතාව ලියන්නට අවස්තාවක් එන තෙක් මම බලා සිටියා. රූකාන්තගේ වචන වලින්ම මං ඒක ලියන්නම්.

"මං ගැයූ ගීත වලින් මං කැමතිම ගීතයක් තමයි අංගනාවෝ කියන ගීතය.. මේ ගීතය සඳහා නැටුම් නිර්මාණය කළේ චන්න විජේවර්ධන.. ඒ නර්තනය ගීතයේ ජනප්‍රියත්වයට බලපෑවා. එයින් පසුව විදේශයකනදී මේ ගීතය වෙනුවෙන් චන්න හා සමවන නර්තන නිර්මාණයක් මං දැක්කෙ මෙල්බර්න් වලදී"

රූ කාන්තගේ ගීය වෙනුවෙන් මෙල්බනයේදී මේ අපූරු නර්තනය නිර්මාණය කළේ අමා සිරිවර්ධන සොයුරිය වීම ගැන මම ආඩම්බර වෙනවා. මේ කතාවත් සමගින් අමා සමග මේ සාකච්ඡාව ආරම්භ කරන්න මම කැමතියි.

## මුහුණට මුහුණ

### ශ්‍රීනාත් මද්දුමගේ

**අමා. ඔබ නැටුමක් නිර්මාණය කරද්දි මූලිකත්වය දෙන්නෙ මොනවගේ කාරණා වලටද?**

නැටුමක් නිර්මාණය කිරීමේදී මම මූලිකත්වය දෙන්නෙ එයට ඉදිරිපත් වන ශිල්පීන්ගේ දක්ෂතා උපරිමයෙන් පෙන්වන්නටයි. ශිල්පීන් ආදුනික නම් ඔවුන්ට අමාරු අසීරු රංග වින්‍යාස උගන්වමින් ඔවුන් අපහසුතාවට පත් නොකර ඔවුන්ගේ හැකියා- වන්ගෙන් උපරිම මට්ටම ලබා ගැනීමටයි මම සැළසුම් කරන්නෙ. ඊට අමතරව නර්තනයේදි සතර අභිනය ම ඉතා මැනවින් භාවිතා කරනවා. ඒ කියන්නෙ අංග චලනය වස්ත්‍රාභරණ හැඟීම් ප්‍රකාශය සහ රංග භාණ්ඩ ඇඳුම් ආයිත්තම් ආදී සියලුම අංග මගේ නර්තනයන්ට මං එක්කර ගන්නවා.

**ඔබ නර්තන ශිල්පයට යොමු වන්නෙ කොහොමද?**

මම මුලින්ම නැටුම් ශිල්පය හැදෑරුවේ ක-ලසිරි බුදවත්ත කලායතනයෙන්. වසර ගණනාවක් මම උඩරට පහත රට සබරගමු කියන නැටුම් ඒම හතාගෙන් ඉගෙන ගත්තා. ඊට පස්සෙ මම පද්මිණී දහනායක මහත්මියගෙන් භරත නාට්‍ය ශිල්පය හැදෑරුවා. 1997 නොවැම්බර් 15 වන දා එල්ෆින්- ස්ටන් රඟහලේදී මගේ කළඑළි මංගල්ලය පැවැත්තුවා.

**ඔබ මෙල්බන් නගරයේ දරු දැරියන්ට නර්තන ශිල්පය උගන්වන දක්ෂ ගුරුවරියක්. මේ ගැන අපි කතා කරමුද?**

ඔව් ශ්‍රිනාත් මම දැනට වසර 7 ක් පමණ තිස්සේ නර්තන ශිල්පය මේ අයට උගන්වනවා. දැනට මගෙන් ළමයි 200ක් පමණ පුහුණුව ලබා විසිර ගිහිල්ලා තිබෙනවා. මට සතුටුයි ඔවුනුත් යම් යම් ප්‍රසංග වල ඔවුන්ගෙ හැකියාවන් ඉදිරිපත් කිරීම ගැන.



දැනට ළමුන් 180ක් පමණ මගේ පන්ති වලට සහභාගි වෙනවා. ඩැන්ඩිනොන් වල සහ සෙන්ට් ඕල්බන්ස් යන ප්‍රදේශ දෙකේ මගේ පන්ති පැවැත්වෙනවා.

**මේ පැවැත්වෙන්නේ කී වෙනි අමා දහර ප්‍රසංගයද?**

මෙ අපේ තුන් වෙනි ප්‍රසංගය. අපි අවුරුදු දෙකකට වරක් මේ ප්‍රසංගය පවත්වනවා. අවුරුදු 3 සිට වැඩිහි- ටයන් දක්වා විවිධ වයස් කාණ්ඩ වලට අයත් දක්ෂ නර්තන ශිල්පීන් ශිල්පිණියන් මේ ප්‍රසංගයට නර්තනයෙන් එකතු වෙනවා.

**ඔබ හැම ප්‍රසංගයකදීම අලුත් යමක් කරන්නට වෙර දරනවා. මේ වතාවේ ඔබ කරන්නට යන විශේෂත්වය මොකක්ද?**

මේ වසරේ අපි සාලිය අසෝකමාලා ඓතිහාසික පුරාවෘත්තය අසෝකමාලා නමින් පැයක පමණ මුද්‍රා නාට්‍යයක් හැටියට ඉදිරිපත් කරනවා. ඒ මුද්‍රා නාට්‍යය මෙහි සිටින රසික සහෘදයන්ට නවමු අද්දැකීමක් වේවි. ඊට අමතරව මේ ප්‍රසංගයේදී උඩරට පබහතරට මෙන්ම නව නිර්මාණ වලින් යුත් නැටුම් රැසක් ළමුන් විසින් ඉදිරිපත් කරනවා.

**ඇයි ඔබ නව නිර්මාණ වලට විශේෂ තැනක් දෙන්නෙ?**

එමෙ විශේස තැනක් දෙනවා නෙවෙයි. නමුත් නව නිර්මාණ කරන්න මගේ විහාල කැමැත්තක් තියෙනවා. ඒකට හේතුව තමයි අපි දන්නවා හැම දෙයක්ම එන්න එන්නම අලුත් වෙනවා. අපි ජීවත් වෙන්නෙ තාක්ෂණය විසින් වෙනස් කරමින් තිබෙන ලෝකයක. තරුණ පරපුර බොහෝ වේලාවට ජීවත් වෙන්නෙ මේ රටාවන් තුළයි. ඉතින් ඒඅ ය දිනා ගන්න නම් සම්ප්‍රදායත් රැක ගනිමින් නව නිර්මාණත් අප ඉදිරිපත් කළ යුතු වෙනවා. නව නිර්මාණ වලදී සාම්ප්‍රදාය තුළ තිබෙන යම් යම් හිරවීම් වලින් නිදහස් වෙලා අලුත් යමක් කරන්න අපි උත්සාහ කරනවා.

## ජූනි 10 වන දා බීසන් සෙන්ටර් හිදී සවස 6 ට




**ඒ කියන්නෙ ඔබ සීමා වලින් කොටු වෙලා නොඉඳ විාවිධ ඉසව් කරා ඔබේ නර්තනය ගෙන යන්න උත්සාහ කරනවා කියන එක නේද?**

ඔව්. හරියට හරි. නමුත් අපේ සම්ප්‍රදාය රැක ගත යුතුයි. අපේ සම්ප්‍රදායික නැටුම් කලාව ළමයින්ට ඉගැන්විය යුතුයි. ඒක තමයි මූලික පදනම. මූලික පදනම නොදැන මොනාවත් කරන්න බැහැ. එතැන ඉඳලයි අපි ඉස්සරහට යන්න ඕනෙ. අපි ජීවත් වෙන්නෙ බහු සංස්කෘතික සමාජයක. ඉතින් අපේ නිර්මාණ එක තැනක තියන්නෙ නැතිව විවිධ ඉසව් ඔස්සේ ඉදිරියටම ලෙන යා යුතුයි කියන එකයි මගේ අදහස.





**මේ විසාල ප්‍රසංගය පිටුපස ඉන්න අය ගැන කතා කරමුද?**

විශේෂයෙන්ම මතක් කරන්න ඕනෙ මගේ සිසු දරු දැරියන්. ඔවුන් විශාල කැපවීමක් මේ සඳහා ගන්නවා. ඒ වගේම දෙමාපියන්. දෙමාපියන්ගේ උනන්දුව සහ උපකාරය නොමැති නම් අපට මෙවැනි ප්‍රසංගයක් කරන්නට කවදාවත් ඉඩ ප්‍රස්තාවක් ලැබෙන්නෙ නැහැ. මම මේ වෙලාවේ ඒ අයට ස්තුති කරන්න මේක අවස්ථාවක් කර ගන්නවා.

ළමයින් 160 ක් පමණ සහභාගි වන මේ ප්‍රසංගයට විවිධ අයුරින් සහය දක්වන සැමට ස්තුති කරන්න කැමතියි.





අමා සිරිවර්ධන අපට සිටින අති දක්ෂ නර්තන ශිල්පිණියක්. ඇය ප්‍රථම වරට ඉදිරිපත් කරන අසෝකමාලා මුද්‍රා නාට්‍යයත් අපේ ප්‍රේක්ෂකයනට අලුත් අද්දැකීමක් වන බ වමට විශ්වාසයි. අපි සියලු දෙනාම ජූලි 10 වන දින බීසන් සෙන්ටර්හිදී පැවැත්වෙන මෙම ප්‍රසංගයට සහභාගි වී අපේ දරු දැරියන්ගේ දස්කම් දැක බලා ගමු. ඔවුනට ශක්තිය සපයමු.